රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක: 14/92

රාජ්‍ය පරිපාලන, පළාත් සභා හා
ස්වදේශ කටයුතු අමාත්‍යාංශය,
නිදහස් චතුරශ්‍රය,
කොළඹ 07.

1992 මාර්තු මස 11 වෙනි දින.

අමාත්‍යාංශ ලේකම්වරුන්,
පළාත් ආණ්ඩුකාර ලේකම්වරුන්,
පළාත් සභා ප්‍රධාන ලේකම්රුන්,
දෙපාර්තමේන්තු ප්‍රධානීන්,
දිසාපතිවරුන්,
රාජ්‍ය සංස්ථා හා ව්‍යවස්ථාපිත මණ්ඩල
සභාපතිවරුන් වෙත.

## රාම්සාන් සමයේ දී සේවා සැපයීම් ලබාදීම.

1991 මාර්තු මස 08 වැනි දින අංක. 9/91 දරණ රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයට ඔබගේ අවධානයට යොමු කරවනු කැමැත්තෙමි.

02. 1992 වර්ෂයේ රාම්ලාන් (රාම්සාන්) උත්සව සමයේ දී මුස්ලිම් භක්තික රාජ්‍ය නිලධාරීන්ට / සේවකයින්ට යාඥ සහ ආගමික වතාවත්වල නිරත විය හැකි වන පරිදි වැඩ පිළිවෙලක් සකස් කරන ලෙස ඉල්ලා සිටිනු ලැබේ.

03. ආගමික සහ යාඥ කටයුතු දිනපතා සිදු කෙරෙන කාල වේලාවන් පහත දැක්වෙන පරිදි වේ.

- පෙරවරු 3.00 සිට පෙරවරු 5.30 දක්වා
- පෙරවරු 6.00 සිට පෙරවරු 7.00 දක්වා
- පස්වරු 6.00 සිට පස්වරු 7.00 දක්වා
- පස්වරු 8.00 සිට රාත්‍රී 10.00 දක්වා

04. මෙම කාලසීමාවන් තුළ දී ආගමික වතාවත්වල යෙදීමට හැකිවන පරිදි සැමවිටම වැඩ මුර සකස් කර දිය යුතුය. එහෙත් අත්‍යාවශ්‍ය අවස්ථාවල දි විශේෂ නිවාඩු අනුමත කිරීම මැනවි.

05. තව ද, 1992 රාම්ලාන් (රාම්සාන්) අවසන්වීමේ දිනට දින 14 කට කලින් රාජ්‍ය, රාජ්‍ය සංස්ථා හා ව්‍යවස්ථාපිත මණ්ඩලවල සුදුසුකම් ඇති මුස්ලිම් නිලධාරීන්ට/ සේවකයින්ට උත්සව අත්තිකාරම් මුදල් ලබාදීමට ද කටයුතු කිරීම මැනවි.

අ.කලේ/ ( එම්.එන්.ජුනයිඩ් )
ලේකම්,
රාජ්‍ය පරිපාලන, පළාත් සභා හා ස්වදේශ
කටයුතු අමාත්‍යාංශය.